සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ..................................

# පෙරදිග සංගීතය I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 26 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. නි̣සරිමගරිගස, නි̣සරිමපමගරිගස, ලෙස ගොඩනැගෙන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර දේශ් රාගයට අනුව ලියවී ඇති පිළිතුර කුමක්ද?

i. නි̣සරිගරිගරිස ii. සනි̣සරිගසනි̣ස iii. නි̣සරිමගරිගස
iv. නි̣සරිමපරිගස v. නි̣සරිමපධපමගරිගස (........)

02. භාගේශ්‍රී රාගයේ මේල ස්වර අයත් පිළිතුර වන්නේ කුමක්ද?

i. සරිගුමපධනිස් ii. සරිගුමපධුනිස් iii. සරිගමපධනිස්
iv. ස̣රිගුමපධනිස් v. සරිගම්පධනිස් (........)

03. නිසමරිමප / මමගුමමගමමගුරිස, මෙම ස්වර කාණ්ඩ දෙකෙහි රාගධාරි ශිල්පාංග දෙක පිළිවෙලින් ඇතුලත් පිළිතුර කුමක්ද?

i. මුඛඩා - තිහායි ii. කන්ස්වර - මුඛඩා iii. ගමක් - කන්ස්වර
iv. උපජ් - ගමක් v. කන්ස්වර - ගමක් ස්වර (........)

04. දේශ් - තිලක්කාමෝද් රාග යුගලය.

i. සමප්‍රකෘති රාගයෝය. ii. උදය සන්ධි ප්‍රකාශ රාගයෝය
iii. උත්තරාංගවාදී රාගයෝය iv. පරමේල ප්‍රවේශක රාගයෝය
v. සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ රාගයෝය (........)

05. රිස | නි̣ධ̣නි̣ | ස - | මගග| යනුවෙන් ආරම්භ වන්නේ,

i. තිලක්කාමෝද් රාගයේ සර්ගම් ගීතයේය. ii. භාගේශ්‍රී රාගයේ සර්ගම් ගීතයේය.
iii. දේශ් රාගයේ මධ්‍යලය ගීතයේය. iv. භාගේශ්‍රී රාගයේ රාගයේ මධ්‍යලය ගීතයේ ය.
v. දේශ් රාගයේ සර්ගම් ගීතයේ ය. (........)

06. උදය සන්ධි ප්‍රකාශ රාගවලට පොදු වූ කියමන වන්නේ,

i. තීව්‍ර මධ්‍යමය පමණක් යෙදීම. ii. රිෂභය හා ධෛවතය ශුද්ධව යෙදීම.
iii. ශුද්ධ මධ්‍යමය පමණක් යෙදීම iv. ශුද්ධ මධ්‍යමය පමණක් රිෂභය, හා ධෛවතය කෝමලව යෙදීම.
v. තීව්‍ර මධ්‍යමය හා කෝමල ධෛවතය පමණක් යෙදීම (........)

07. ස්වර වෙනුවට වචන යොදා ගයනු ලබන තාන අලංකාර

i. සපට් තානවේ. ii. ශුද්ධ තාන වේ. iii. බෝල් තාන වේ.

iv. ගමක් තාන වේ. v. කූට තාන වේ. (........)

08. උත්තර භාරතීය ශාස්ත්‍රීය රාගධාරී ගායනයක් ඉදිරිපත් කිරීමේදී යොදාගත හැකි සුදුසුම භාණ්ඩ යුගලය කුමක් ද ?

i. තබ්ලාව - බටනලාව ii. වීණාව - මෘදංගය iii. තබ්ලාව - වීණාව

iv. තබ්ලාව - තාම්පුරාව v. හාර්මෝනියම් - වීණාව (........)

09. 'ලංකාවේ සංගීත සම්භවය ' නම් කෘතිය ලියන ලද්දේ,

i. ලයනල් රන්වල මහතාය. ii. වින්සන්ට් සෝමපාල මහතාය.

iii. ප්‍රේමවංශ හපුවලාන මහතාය. iv. ඩබ්ලිව්.බී. මකුලොලුව මහතාය.

v. සී.ද.එස්. කුලතිලක මහතාය. (........)

10. සාහිත්‍යමය රසභාවයන්ගෙන් තොර රාග රසය හා ශබ්ද රසය පමණක් ඇති ගායන ශෛලියකි.

i. ධෘපද් ii. ධමාර් iii. තරාණා

iv. භජන් v. ඛ්‍යාල් (........)

11. මාතාංග පඬිවරයා, විසින් රචිත ග්‍රන්ථය කුමක්ද?

i. සංගීත රත්නාකරය ii. භරත නාට්‍ය ශාස්ත්‍රය iii. බෘහද්දේශි ග්‍රන්ථය

iv. රමායනය v. ගීත ගෝවින්දය (........)

12. | 12 | 12 | 123 | යන ආකාරයට මාත්‍රා කැටි වීමෙන් නිර්මාණය වන දේශීය තිත් රූපය කුමක්ද?

i. මැදුම් මහ දෙතිතයි. ii. දෙසුළු මැදුම් තුන්තිතයි.

iii. දෙමැදුම් මහ තුන්තිතයි. iv. සුළු මැදුම් මහ තුන්තිතයි.

v. සුළු දෙමැදුම් තුන් තිතයි. (........)

13. ගතියෙන් අසමාන මිතියෙන් සමාන තාල යුගලය තෝරන්න.

i. දීප් චන්දි - දාදරා ii. දාදරා - ජප්තාලය

iii. ත්‍රිතාලය - තිලවඩා iv. ජප්තාලය - දීප්චන්දි

v. ජප්තාලය - තිලවඩා (........)

14. තබ්ලාවේ දයාං සහ බයාං කොටස්වලින් තනිව උපදවාගත හැකි අවනද්ධ අක්ෂර පිළිවෙළින් ඇතුලත් පිළිතුර තෝරන්න.

i. න, ගෙ ii. කත්, කි iii. තිං, තුං iv. ගෙ, න v. ග, ත (........)

15. ලෝක සංගීත පද්ධතින් අතරින් 'මකාමත්' සංගීතය ලෙසින් හඳුන්වනු ලබන්නේ,

i. ඉන්දුනීසියා සංගීතයයි. ii. ඉස්ලාමික් සංගීතයයි. iii. කර්ණාටක සංගීතයයි.

iv. චීන සංගීතයයි. v. භාරතීය සංගීතයයි. (........)

16. උඩරට ශාන්ති කර්ම ගීතනුවල සංගීත අභාසය ලත් ගැමි රංග ශෛලිය මින් කුමක්ද?

i. සොකරි ii. නාඩගම් iii. කෝලම්

iv. නූර්ති v. නව නාට්‍ය (........)

17. ශාන්තිකර්ම අතුරින් සබරගමු ශාන්ති කර්මයන්ට අදාළ ගීතය ඇතුලත් පිළිතුර තෝරන්න.

i. අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට ii. උපත පෙරා කළිඟු පුරා

iii. එර්දිවෙලා උඩු ගුවනේ iv. නිරිත කොන යුතා මල් මල් සුවදැති

v. ගුණ දැනේ බෝසත් අනේ (........)

18. පහතරට, උඩරට, සබරගමු යන ශාන්තිකර්මවලට ආවේනික ප්‍රධාන ශාන්තිකර්ම පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.

i. රටයකුම, කොහොඹා කංකාරිය, පහන් මඩුව
ii. කොහොඹා කංකාරිය, රටයකුම, පහන්මඩුව
iii. පහන් මඩුව. රටයකුම, කොහොඹා කංකාරිය
iv. කොහොඹා කංකාරිය, පහන් මඩුව, රටයකුම
v. රටයකුම, පහන්මඩුව, කොහොඹා කංකාරිය (........)

19. කායදා, පල්ටා, මුඛඩා යන වාද්‍ය ශිල්ප ක්‍රම යොදාගන්නා වාද්‍ය භාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.

i. වයලීනය ii. සිතාරය iii. එස්රාජය
iv. තබ්ලාව v. ගිටාරය (........)

20. සංගීත භාණ්ඩ වල ව්‍යුහය පිළිබඳ සාකච්ඡා කිරීමේදී ජවාරි, සහ සවුන්ඩ් පෝස්ට් යන යෙදුම් භාවිතා කළහැකි සංගීත භාණ්ඩ පිළිවෙලින් ඇතුලත් පිළිතුර තෝරන්න.

i. ගිටාරය, වයලීනය ii. එස්රාජය, වයලීනය iii. සිතාරය - වයලීනය
iv. වයලීනය - සිතාරය v. සිතාරය - එස්රාජය (........)


21. රාගධාරි ශාස්ත්‍රීය පදනමක් යටතේ නිර්මාණය වී ඇති 'මුව මුක්තාලතා' යන ගීතයට පදනම් වූ රාගය කුමක්ද?

i. භාගේශ්‍රී ii. දේශ් iii. ශිවරංජනි iv. කලාවති v. පීළු (........)

22. භාගේශ්‍රී රාගාශ්‍රිතව තනු නිර්මාණය වූ සරල ශාස්ත්‍රිය ගීතය ඇතුලත් පිළිතුර වන්නේ,

i. හෝපලු වනපෙත ii. හංසරාජනී iii. කමලාසනී
iv. චාමර පවන් සලා v. මාරම්බරී (........)

- **අංක 23 සිට 25 තෙක් ප්‍රශ්ව වලට පහත රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




23. F major 'ස්කේලයට (Scale) අයත් ස්වර වලට හිමි අංක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තොරන්න.

i. 1 - 3 - 5 - 7 - 8 - 10 - 11 - 13 ii. 1 - 3 - 5 - 6 - 8 - 10 - 12 - 13
iii. 1 - 3 - 4 - 5 - 7 - 8 - 9 - 10 - 11 - 13 iv. 3 - 5 - 7- 8 10 - 12 - 14 - 15
v. 3 - 5 - 6 - 8 - 10 - 11 - 13 - 15 (........)

24. දී ඇති පුවරුවේ 3 + 7 + 10, 8 + 12 + 15, 5 + 10 + 14 අංක වලට හිමි ස්වර වලින් නිර්මාණය වන Family Chords (ෆැමිලි කෝඩ්ස්) අයත් ස්කේලය

i. F major Sacle ii. C major Scale iii. A major Scale
iv. G major Scale v. D major Scale (........)

25. දී ඇති ස්වර පුවරුවේ 5 + 8 + 12 අංකවලට හිමි ස්වර එකවර වාදනය කළ විට ලැබෙන (Chord) කෝඩ් එක කුමක්ද?

i. A major  ii. C minor  iii. A minor  iv. G major  v. F major  (........)

- **අංක 26 - 30 දක්වා ප්‍රශ්න වලට පහත දැක්වෙන ඡේදය උපයෝගී කරගන්න.**

**උසස් පෙළ කේවල ව්‍යාපෘතිය සඳහා පැවැත්වූ ඒක පුද්ගල ප්‍රසංගයේදී ගයන්ත සිසුවා විසින් ඉදිරිපත් කළ ශාස්ත්‍රීය රාගධාරී මධ්‍යලය වාදනය සඳහා යොදාගත්තේ පසපස ලෙස සුසර කරන ලද තත් හතරකින් (4) යුත් ස්වර වාද්‍ය භාණ්ඩයකි. එහිදී ඔහු වැයූ එක් තානාලංකාරයක් වන්නේ,**

**නිස රිම පනි | ස - රිගු රිස නිධ | පධ මග රිග | නිධ පම ගරි ගස**

26. ගයන්ත විසින් වැයූ රාගය නම් කරන්න. ...............................................

27. ගයන්ත විසින් වාදනය කළ රාගයේ මේල ස්වර ලියන්න. ...............................................

28. ඉහත විස්තරයට අනුව ඔහු වාදනය කළ සංගීත භාණ්ඩය නම් කරන්න. ...............................................

29. මෙම තානාලංකාරය අයත් රාගයේ ස - රිග රිස නිධ ස්වර කාණ්ඩය තුළ යෙදෙන කෝමල ගාන්ධාරය නම් කරනුයේ කුමන ස්වරයක් ලෙස ද? ...............................................

30. ඔහු වැයූ තානාලංකාරයට අදාල තාලය කුමක්ද? ...............................................

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුර සපයන්න.**

31. තබ්ලාවේ නිර්මාතෘවරයා නම් කරන්න. ...............................................

32. වැදි ගී ඇසුරින් නිර්මාණය කළ ජනප්‍රිය සරල ගීතයක් නම් කරන්න. ...............................................


33. G major (Scale) ස්කේලය සඳහා ............................................... යන ස්වර අයත් වේ.

34. ගග රිග ගරි ගග රිස- නිධපමගරිස මෙම තානාලංකාර වර්ගය නම් කරන්න.

35. සරෝද්, සාරාංගි, වයලින් වැනි භාණ්ඩයන්ගෙන් කරනු ලබන මීන්ඩ් වාදනය හඳුන්වන්නේ කුමන නමකින්ද?

...............................................

- **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පහත රූප සටහන් උපයෝගී කරගන්න.**




36. කෝමල රිෂභය හා කෝමල ධෛවතය යන ස්වර සඳහා නිශ්චිත පර්දා පිහිටුවා <u>නොමැති</u> භාණ්ඩ යුගලය ............................................... හා ............................................... වේ.

37. A රූප සටහනෙන් දැක්වෙන සංගීත භාණ්ඩයේ ප්‍රධාන තත් ගණන ............................................... වන අතර D රූපසටහනෙන් දැක්වෙන සංගීත භාණ්ඩයේ ප්‍රධාන තත් ගණන ............................................... කි.

38. B හා D සංගීත භාණ්ඩ වාදනයේ නවීනත්වයක් උසුලන ඉන්දියානු ශිල්පීන් දෙදෙනෙකු පිළිවෙලින් නම් කරන්න.

........................................................................................ ........................................................................................

39. ජලා වාදනයේ දී උපයෝගී කරගත හැකි ලෙස විශේෂ තත් යොදා ඇති සංගීත භාණ්ඩය ..................................................................... වන අතර එම භාණ්ඩය වාදනයට යොදා ගන්නා උපකරණය ........................................................... වේ.

40. සංගීත භාණ්ඩයක ධ්වනි ගුණය කෙරෙහි (Sound hole) නාද විවරය උපයෝගී වේ. එම භාණ්ඩ යුගලය ...................................................................... සහ ............................................... වේ.

- **අංක 41 සිට 50 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

41. මහනුවර යුගයේ රාජ සභාවට අයත් සංගීත නැටුම් ආයතන දෙකක් නම් කරන්න.

........................................................................................ ........................................................................................

42. පාසල් සංගීත අධ්‍යාපනයට රාගධාරී සිංහල, ගීත රැසක් එක් කරමින් වින්සන්ට් සෝමපාල මහතා ලියූ ග්‍රන්ථය ................................................................ වන අතර ........................................................ ග්‍රන්ථය විමල් අභයසුන්දර මහතාගේ කෘතියකි.

43. ගායනය, වාදනය, නර්තනය, යන අංගත්‍රයේ මනා වූ සංකලනය සංගීතය යැයි යන අදහස දැක්වෙන්නේ ....................................................................... පඬිතුමාගේ ...................................................... ග්‍රන්ථයේ ය.

44. අනාසාතාත්මක ගැමි ගී වල විශේෂතා දෙකක් ලියන්න.

........................................................................................ ........................................................................................

45. උදාත්ත .................................................. සහ .................................................. වශයෙන් වේද ගායනා නාද ස්ථාන තුනකට ගායනා කළ බව පැරණි පොත පතේ සඳහන් වේ.

46. දේශීය තිත්තාල පද්ධතිය අනුව තනිතිතේ ප්‍රභේද තුන සහ දෙතිතේහි තිත් රූප තුන නම් කරන්න.

........................................................................................ ........................................................................................

47. ඒක ස්වර (Meldoy) මත ................................................................ පද්ධතිය හා බහුස්වර (Harmony) මත ............................................................ පද්ධතිය බිහිවී ඇත.

48. ‘උදයට පායන හිරු දෙවියන්ටයි’ යන ගී පදයේ සදැස්මස් ගනන ............................................................ සහ ගීමත් ගණන .............................................................. වේ.

........................................................................................................................................................................

49. එක් හුස්මක් දීර්ඝ කාලයක් රඳවා ගෙන ගායනා කිරීමේ හැකියාව දියුණු කර ගැනීමේ දී වඩාත් සුදුසු අභ්‍යාස දෙකක් ලියන්න.

........................................................................................ ........................................................................................

50. විද්‍යුත් තැපැල (E-mail) පහසුකම මගින් ගීතයක් හුවමාරු කර ගත හැකිය. ඔබට මෙම (E-mail) පහසුකම් නොමිලේ ලබාදෙන සමාගම් දෙකක නම් ලියන්න.

........................................................................................ ........................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

54 | S | II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ..................................

# පෙරදිග සංගීතය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත දැක්වෙන ස්වර සංගතීන් කුමන රාගයකට අයත් දැයි නම් කරන්න.

a. සරිමප, පධමගරි, රිප, මග, රිග, නි̣ස

b. මධනි̲ධ, ස්ං නි̲ධ, මපධග̲, මග̲රිස

c. ප̣නිසරිග, ස, රිපමග

i. ඉහත ස්වර සංගීතීන් අයත් වන රාග තුන ඉංග්‍රීසි අක්ෂරය සමඟ ලියා දක්වන්න. (ල. 1 x 3)

ii. ඉන් ඔබ කැමති රාගයකට අයත් ආරෝහණ අවරෝහණවාදී, සංවාදි, මුඛ්‍යාංග, මේලය, ජාතිය, ගාන සමය, යන රාග විස්තර ලියා දක්වන්න. (ල. 1 x 7)

iii. ඔබ රාග විස්තර නොලියූ ඉහත දැක්වෙන වෙනත් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීතයක් හෝ වාදිතයක් ස්වර ප්‍රස්තාර කර මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල. 10)

02. නිර්දේශිත රාග දෙකකට අදාල කරගතහැකි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

a. ජාතිය පිළිබඳ මත තුනක් ඉදිරිපත් වන රාගයකි.

b. ඛමාජ් මේලගතව අවරෝහණයේදී රිෂභය වක්‍රව යෙදෙන රාගයකි.

i. ඉහත තොරතුරු අනුව රාග දෙක නම් කරන්න. (ල. 04)

ii. (b) රාගයට සමප්‍රකෘතිවන රාගය නම් කර සමප්‍රකෘති වන අයුරු කරුණු 04 ක් ඇසුරින් පහදන්න. (2 x 4 = 08)

iii. (a) රාගයට අදාලව ස්වර සංගිතින් ඇසුරින් ස්වර 30 කට නොඅඩු ආලාප කණ්ඩයක් ලියා දක්වන්න. (ල. 08)

03. පහත දැක්වෙන්නේ තබ්ලාවෙන් වැයෙන අවනද්ධ අක්ෂර කිහිපයකි.

**න ධ ත ගෙ ධිං තිං ග ගි තුං**

i. දී ඇති අවනද්ධ අක්ෂර වලින් තනිව උපදවා ගතහැකි අක්ෂර පමණක් දයාවේ සහ බයාවේ මුහුණත් රූප සටහන් දෙකක ලකුණු කරන්න. (ල. 06)

ii. දී ඇති අවනද්ධ අක්ෂර භාවිතා කර ගොඩ නගා ගත හැකි නිර්දේශිත තාල තුනක් නම් කරන්න. (ල. 03)

iii. ඉන් ඔබ කැමති එක්තාලයක් නියමිත තාල සංඥා යොදා සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ල. 06)

iv. ඔබ සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කළ තාලයට සමානව මාත්‍රා විභාග වන දේශිය තිත් රූපය නම් කර නියමිත තිත් සංඥා සහිතව බෙරපදයක් ප්‍රස්තාර කරන්න. (ල. 05)

## II කොටස

04. නූර්ති සහ නාඩගම් සංගිතය ලංකාවේ සංගීත විකාශනය කෙරෙහි බලපෑ බව පිළිගත් මතයකි.

i. නාඩගම් සංගිතයට බලපෑ සංගීත සම්ප්‍රදාය නම් කර, නාඩගම් සහ එම සංගිත සම්ප්‍රදාය අතර ඇති සම්බන්ධය පිලිබඳ කෙටි විමසුමක් කරන්න. (ල. 04)

ii. නූර්ති රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ 04 ක් ලියා දක්වන්න. (ල. 04)

iii. තෝඩායම, ඉන්නිසය, උරුට්ටුව, දෙහොරාව, යන සංකල්ප වලින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ල. 12)

05. දේශිය ගැමි ගීතය ජන ජීවිතයේ විවිධ අවස්ථාවන් පිළිබිඹු කරයි. ඒ පිළිබඳව පහත සඳහන් i, ii කරුණු ඇසුරින්
උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. සාමුහිකත්වය පිළිබිඹු කරන අවස්ථා (ල. 06)

ii. සන්නිවේදනයකාරකයක් වශයෙන් යොදාගත් අවස්ථා (ල. 06)

iii. පහතරට ශාන්ති කර්මයකට අයත් ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

## III කොටස

06. මෙරට ව්‍යවාහාරික සංගීතයේ ඇතැම් නිර්මාණ සඳහා උතුරු ඉන්දියානු, රාගධාරි සංගීත සම්ප්‍රදාය ඇසුරු කර ඇත.

i. ඔබ උගත් රාගධාරී ශාස්ත්‍රිය පදනමක් සහිත සිංහල සරල ගීතයක ඇතුලත් රාගධාරී අංග 05 ක් නම් කරන්න. (ල.05)

ii. ඔබ උගත් රාගාධාරී ශාස්ත්‍රිය පදනමක් සහිත සිංහල සරල ගීතයක ඇතුලත් රාගධාරී අංග හතරක් එම ගීතයෙහි දැක්වෙන අවස්ථා උදාහරණට ගනිමින් රසවින්දානාත්මක විමසුමක් කරන්න. (ල.12)

iii. ඉහත ඔබ තෝරාගත් ගීතය හැර වෙනත් ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල ජනප්‍රිය සරල ගීතයක් නම්කර එහි ගායකයා / ගායිකාව නම් කරන්න. (ල.03)

07. පහත දැක්වෙන මාතෘකා හතරෙන් දෙකක් පිළිබඳව උදාහරණ සහිතව කෙටි සටහන් ලියන්න.

i. රාග ගාන සමය

ii. මීන්ඩ්, මූර්කි සහ තිහායි

iii. තරාණා ගායන ශෛලිය

iv. වයලීනය සහ තබ්ලාවේ හඬෙහි ගුණාත්මකභාවයට බලපාන සාධක (10 x 2 = 20)

08. පහත සඳහන් බටහිර රේඛා මණ්ඩලයේ ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. දී ඇති ප්‍රස්තාරයෙන් 1 - සිට 05 තෙක් අංකවලින් දැක්වෙන සංකේත නම් කර ඉන් තුනක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල. 08)

ii. ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට හරවා ප්‍රස්තාර කරන්න. (ල. 08)

iii. ඉහත ප්‍රස්තායට අදාල ස්කේලය (Scale) නම් කර එම ස්කේලයට (Scale) භාවිතා කළ හැකි මූලික කෝඩ්ස් (Family chords) ත්‍රිත්වය ලියා දක්වන්න. (ල. 04)

## දෙවන වාර පරීක්ෂණය - 2019
## පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය
## I පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | v | 11. | iii | 21. | v | |
| 2. | iv | 12. | ii | 22. | i | |
| 3. | v | 13. | iii | 23. | ii | |
| 4. | i | 14. | i | 24. | iv | |
| 5. | ii | 15. | ii | 25. | iii | 1 x 25 = 25 |
| 6. | iv | 16. | i | 26. | දේශ් රාගය | |
| 7. | iii | 17. | v | 27. | සරිගමපධනි | |
| 8. | iv | 18. | i | 28. | වයලීනය | |
| 9. | v | 19. | iv | 29. | විවාදි ස්වරය | |
| 10. | iii | 20. | iii | 30. | දීප් චන්දි තාලය | |

31. අමීර් ඛුෂ්රු
32. මාමිනි දෙයියා, නංගිට බැදපු මල් වියනයි.... ආදී වශයෙන්
33. පධනිසරිගම́ප | GABCDEF#G
34. ගමක තාන
35. සූත්
36. සිතාරය / එස්රාජය (A හා B)
37. 07 කි - 04 කි.
38. අශිෂ්චන්ද්‍ර බෙනර්ජි / වි.ජී. ජෝග් ආදී වශයෙන්
39. සිතාරය / මිස්රාබය
40. ගිටාරය / වයලීනය
41. කවිකාර මඩුව / වාහල ඉලංගම ආදී වශයෙන්
42. භාවිත ගීත / සංගීත සංහිතා
43. සාරංග දේව පඩිතුමා / සංගීත රත්නාකරය
44. ඒකලව ගායනය උච්ච ස්වරයෙන් ගැයීම
45. අනුදත්ත / ස්වරිත
46. සුළු, මැදුම්, මහ තනි තිත් / සුළු මැදුම්, මැදුම් මහ, සුළු මහ දෙතිත
47. පෙරදිග සංගීත / අපරදිග සංගීත
48. 16 යි / 24 යි.
49. පුළුන් කැබැල්ලකට පිඹීම / ඉටිපන්දම් දැල්ල නොනිමෙන සේ පිඹීම.
50. Google | yahoo | MSN